**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 253- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්තමානයේ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 10 කින් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6.3 ක කුලී ආදායමක් හිඟව පැවති අතර මින් රු.මිලියන 1.4 ක මුදලක් මාස 12 කට වඩා පැරණි ශේෂයන් විය. | තවදුරටත් අයවිය යුතු මුදල් අය කර ගැනිම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් රැස් කර ගත යුතුය. |
| (ආ) | 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) ඡේදය අනුව සෑම මසකම ගිණුම් සාරාංශ මගින් හර හා බැර කරන ලද දායක මුදල් පිළිබඳ වාර්තාවක් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව දක්වා තිබුණ ද, එම විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් ආයතන විසින් බැර කරන ලද රු.මිලියන 22,080.9ක දායක මුදල් පිළිබඳ බැර නිවේදන ගෙන්වා ගැනීමට හා වර්ෂය තුල සිදුකරන ලද රු.මිලියන 3.6ක හර කිරීම්වලින් රු.මිලියන 3.5 ක හර කිරීම් තහවුරු කර ගැනීම සඳහා අදාල ආයතන වලින් හර නිවේදන ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | යම් යම් වෙනස්කම් හේතුවෙන් එක් එක් ශීර්ෂයන්ට අදාල ආයතන එකතුවීම්, අහෝසිවීම් ආදී හේතූන්ද මෙම විචල්‍යතාවයන් කෙරෙහි බලපානු ඇති අතර ආදායම් ගිණුමට හර කිරීම් සම්බන්ධව අදාල ආයතන වලින් හර නිවේදන ඉල්ලා යවා ඇති අතර මේ වන විටත් හර නිවේදන ලැබෙමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාජ සංරක්ෂණ දායක මුදල් (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල්) මධ්‍යම රජයට හා ආදායම් ගිණුම් යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාජ සංරක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොමැති වීම තුල, ඒ අනුව හිමිවන වැන්දඹු/වැන්දඹු පුරුෂ හා | රාජ්‍ය අංශයේ අනෙකුත් ආයතනයන්හි සහයෝගය නොමැති වීමෙන් (online Reregistration කිරීම සියළු රාජ්‍ය ආයතන සිදු නොකිරීම) මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අකර්මණ්‍ය වී ඇති බව. | දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන දායක මුදල් නිශ්චිතව ලැබුණේ දැයි තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

අනන්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩසටහන් (1) යටතේ වැය විෂයයන් 3 ක් සඳහා අයවැය ගත ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.6,500,000 ඉක්මවා මුදල් රෙගුලාසි 66/69 මඟින් රු.4,580,000 ක් එනම් සියයට 70.46 ක ප්‍රතිපාදන මාරු කිරීමක් සිදු කර ඇති අතර ඒ අනුව ශුද්ධ වියදම රු.11,002,993 ක් විය. | කාර්යාල කටයුතු ව්‍යාප්ත වීම මත කාර්යාල උපකරණ මිලදී ගැනීමටත්, නිවාඩු නිකේතන සඳහා රෙදි සෝදන යන්ත්‍ර මිලදී ගැනීමටත් අවශ්‍ය ප්‍රතිපාදන අතිරික්ත ප්‍රතිපාදන පැවති වැය විෂයන්ගෙන් මාරු කරවා ගෙන යොදා ගන්නා ලද බව. | නිවැරදිව වියදම් හඳුනා ගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | වැය විෂයය අංක 2507 පර්යේෂණ හා සංවර්ධන වියදම සඳහා අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු.700,000 ක් වර්ෂය තුළ වියදම් කිරීමකින් තොරව වෙනත් වැය විෂයයන්වලට මාරුකර තිබීමෙන් වියදම් නිසි ලෙස හඳුනාගැනීමකින් තොරව වියදම් ඇස්තමේන්තු කිරීම සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිත වූ පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ අතර ප්‍රතිපාදන වඩා කාර්යක්ෂමව යොදා ගැනීමේ අරමුණින් අවශ්‍යතාවය අනුව මාරු කර අත්‍යවශ්‍ය කාර්යයන් සිදු කර ඇති බව. | නිවැරදිව වියදම් හඳුනා ගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් රු.10,350,870 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023/12/31 දිනට අනෙකුත් වියදම් රු.10,350,870 අඩුවෙන් දක්වා තිබූ බව සඳහන් කරත් ඊට අදාළ වවුචර්පත් ගිණුම් අංශයට ඉදිරිපත් කර තිබුණේ 2024 වර්ෂයේ බැවින් 2023 වර්ෂයට අදාළ බැරකමක් ලෙස බැරකම් ලේඛනයේ සටහන් නොකරන ලද බව. | බැරකම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳව හා අභ්‍යන්තර පාලනය පිළිබඳ සමාලෝචනයන් සිදුකර කලින් කලට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි අත්‍යවශ්‍ය වෙනස්වීම් සිදුකර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2010 දෙසැම්බර් 16 දිනැති අංක 13/2010 දරන හා 2013 සැප්තැම්බර් 20 දිනැති අංක 03/2013 විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | 473,617 | යළි විවාහ වන වැන්දඹුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් සියයට 50 ක් හිමි වුවද නැවත විවාහයෙන් පසුවද සම්පූර්ණ වැටුප ගෙවා තිබීම නිසා හංවැල්ල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තහවුරු කර ගැනීම සඳහා වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විමසා යවා ඇති බව හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | දෙදෙනෙකු වෙත විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට දත්ත පද්ධතියට ඇතුළත් කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇති බව. | |
| (ආ) | 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 31,953,239 | රාජ්‍ය සේවකයකු ලබන රු. 7,800 ක ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත්, මියගිය හා ආබාධිත හමුදා නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත හමුදා සේවා වැටුප සමඟ දත්ත පද්ධතිය අනුව අවස්ථා 116 කදී ද, ඉබ්බාගමුව වරකාපොල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 14 කදී ද ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | අය කර ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සඳහන් කර ඇති බව. (දත්ත පද්ධතිය අනුව හඳුනා ගත් අවස්ථා සඳහා පිළිතුරු ලබා දී නොමැත.) | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | 94,478,613 | ජීවන වියදම් දීමනාව සහිතව රජයේ වැටුපක් ලබන්නේ නම් එලෙස වැටුප් ලබන කාල සීමාව තුලදී විශ්‍රාම වැටුපට ජීවන වියදම් දීමනාව හිමි නොවුණද , එසේ ජීවන වියදම් දීමනාව ගෙවීම හේතුවෙන් කලුතර, දඹුල්ල, මැදදුම්බර, හංවැල්ල, බමුණාකොටුව, මාතර, මාවනැල්ල, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දත්ත පද්ධතිය අනුව අවස්ථා 269 කදී ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සඳහන් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 12,328,059 | ජීවන වියදම් දීමනාව රු.7,800 දක්වා ලබා ගත හැකි වුවද දඹුල්ල, හංවැල්ල, වරකාපොල, බමුණාකොටුව, මාතර, කෑගල්ල, ඉබ්බාගමුව, වීරඹුගෙදර, හිඟුරක්ගොඩ, යටිනුවර, බිංගිරිය, ඉබ්බාගමුව, නාරම්මල, කුරුණෑගල, අලව්ව, පොල්ගහවෙල හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 64 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි. | හිඟ සහිතව ඉදිරියේදී ගෙවීම් කිරීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දැනුම් දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 13,743,400 | විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා අවස්ථාවල මාසිකව ගෙවනු ලැබූ අන්තර් දීමනාව ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් හංවැල්ල, මාතර, කෑගල්ල, අකුරණ, යටිනුවර, බිංගිරිය, මාවනැල්ල, දිවුලපිටිය, කලුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා දත්ත පද්ධතිය මඟින් හඳුනාගත් විශ්‍රාමිකයින් 47 දෙනෙකු සඳහා අන්තර් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ඉදිරියේදී අයකර ගන්නා බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සඳහන් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 ජුනි 11 දිනැති අංක 1/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 2,522,000 | යම් පුද්ගලයෙකු වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ යැපීම් දීමනාව ලබාගන්නා අවස්ථාවක එම වැන්දඹු විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2019 ප්‍රකාරව සංශෝධනය කළ පසු යැපීම් දීමනාව සඳහා ගෙවනු ලබන අන්තර් දීමනා ගෙවීම නතර කළ යුතු වුවද කෑගල්ල හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එසේ නතර නොකර යැපීම් | ගෙවන ලද අන්තර් දීමනාව නතර කර ඇති අතර වැඩිපුර ගෙවන ලද දීමනාව වාරික වශයෙන් අය කර ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරු සඳහන් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | දීමනාව වෙනුවෙන් අන්තර් දීමනාව ගෙවීමෙන් එම දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ඉ) | 2019 ජූලි 26 දිනැති අංක 1/2019 සංශෝධන II දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 10,337,836 | වයස අවුරුදු 55 දක්වා ත්‍රිවිධ හමුදා මඟින් වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්ට හා යැපෙන්නන්ට වැටුප් පරිවර්තනය අදාල නොවන බව දක්වා තිබියදී දත්ත පද්ධතියට අනුව හමුදා වැටුප ලබන යැපෙන්නන් 45 දෙනෙකුගේ හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 04 දෙනෙකුගේ විශ්‍රාම වැටුපද සංශෝධනය කර ගෙවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | නිවැරදි වැටුපෙහි පිහිටුවා ඇති අතර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව වරකාපොල ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2022 ජනවාරි 20 දිනැති අංක 01/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | | | |
| | • 2 වන ඡේදය | 1,995,000 | දඹුල්ල, බිංගිරිය, හිඟුරක්ගොඩ, හා බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 18 දෙනෙකු සඳහා ඔවුන්ට හිමි රු.5000ක දීමනාව ගෙවා නොතිබීම හේතුවෙන් එම දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි. | ගෙවීම සඳහා කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරු සඳහන් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | • 2(ii) ඡේදය | 21,640,000 | වැන්දඹු විශ්‍රාම වැටුප ලබමින් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට, වැටුප සමඟ රු.5,000 දීමනාව හිමි වන විට විශ්‍රාම වැටුප සමඟ මෙම දීමනාව හිමි නොවන බව දක්වා තිබුණද දත්ත | රු.5000 දීමනාව ගෙවීම නතර කර ඇති අතර වැඩිපුර ගෙවූ මුදල් අයකිරීමට දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | පද්ධතියට අනුව රාජ්‍ය නිලධාරීන් 223 දෙනෙකුට වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ 2022 ජනවාරි මස සිට 2023 අගෝස්තු මාසය දක්වා රු.5,000 දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | | |
| | • 2(iii) ඡේදය | 3,509,000 | මියගිය ත්‍රිවිධ හමුදා නිලධාරින් වෙනුවෙන් ඔවුන්ගේ අවුරුදු 55 දක්වා වැටුප් හිමි යැපෙන්නන්ට විශ්‍රාම වැටුප සමඟ රු.5,000 විශේෂ දීමනාව හිමි නොවන බව දක්වා තිබුණද දත්ත පද්ධතිය අනුව යැපෙන්නන් 39 දෙනෙකු සඳහාද ඉබ්බාගමුව, කෑගල්ල, වරකාපොල හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යැපෙන්නන් 13 දෙනෙකු සඳහාද සේවා වැටුප සමඟ විශේෂ දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | රු.5000 දීමනාව ගෙවීම නතර කර ඇති අතර වැඩිපුර ගෙවන ලද මුදල වාරික වශයෙන් අය කිරීමට නියමිත බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2022 ජුනි 22 දිනැති අංක 14/2022, 14/2022(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2022 සැප්තැම්බර් 20 දිනැති අංක 06/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 47,246,326 | විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් විධිමත් පරිදි ලියාපදිංචි නොවීම නිසා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවනු ලැබුවද නිලධාරියා හඳුනාගත නොහැකි බැවින් දායක මුදල් මාසිකව (2022 නොවැම්බර් සිට 2023 පෙබරවාරි දක්වා) හඳුනානොගත් ලැබීම් ලෙස පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව තොරතුරු තාක්ෂණ පද්ධතියෙහි නිවැරදි ලෙස ලියාපදිංචි නොවූ සහ ස්ථාවර නියෝගයකින් නොවන ක්‍රමවේද ඔස්සේ සහ හඳුනා ගැනීමට යොමුවක් නොමැතිව මුදල් බැර කිරීම හේතුවෙන් නිර්මාණය වී ඇති මෙම මුදල් ශේෂය හඳුනා ගන්නා තෙක් පොදු තැන්පතු ගිණුමක බැර කර ගිණුම් ගත කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 02 ක් ඉක්මවූ රු.5,237,605ක තැන්පත් මුදල් රෙගුලාසි 571(3) පරිදි ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට ගැනීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය. | මිල්කෝ ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් අයවීමට ඇති හිඟ ගොඩනැගිලි කුලී අයවන තෙක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇති අතර ජාතික විශ්‍රාමික දිනය වෙනුවෙන් පැවැත්වෙන උත්සව සඳහා පෞද්ගලික ආයතන විසින් පරිත්‍යාග කරන ලද මුදල් ඉදිරි විශ්‍රාමික උත්සව සඳහා ප්‍රයෝජනයට ගැනීමට පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගන්නා ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.7 බැංකු ගිණුම් මෙහෙයවීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැංකු ගිණුම් දෙකකට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව හඳුනා නොගත් ලැබීම් වටිනාකම රු.13,669,514 ක් වූ චෙක්පත් 125 ක් 2024 මැයි 16 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | හඳුනා ගැනීම සඳහා කටයුතු කරමින් සිටී. | හඳුනානොගත් ලැබීම් කඩිනමින් හඳුනා ගෙන නිරවුල් කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට හා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අදාළ බැංකු ගිණුම් පසුගිය වර්ෂ ගණනාවක සිටම අක්‍රීය ගිණුම් ලෙස පවතින අතර ඒවා වසා දැමීම හෝ ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2006 අනුව අයවැය යෝජනා අංක 425 හා 426 මඟින් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව මහා භාණ්ඩාගාරය විසින් පත් කරනු ලැබූ විශේෂ කමිටුවකින් මෙම අරමුදල් වසා දැමිය යුතු බවට නිර්දේශ කර ඇත. මෙම අරමුදල් පාර්ලිමේන්තු පනතකින් ආරම්භ කර ඇති බැවින් එම අරමුදල් වසා දැමීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා තෙක් බැංකු ගිණුම් වසා දැමීමට නීත්‍යානුකූල බලය ලබා දීමක් මෙතෙක් සිදු කර නොමැති බව. | අක්‍රිය ගිණුම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් අයකරගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රුපියල් මිලියන 936.1 ක් විය. මෙම වටිනාකම, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රුපියල් මිලියන 1.5 කින්ද, වර්ෂ 5 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රුපියල් මිලියන 48.9 කින්ද හා වර්ෂ 5 ට අඩු කාලයකට අයත් රුපියල් මිලියන 885.7 කින්ද සමන්විත විය. | 2023/12/31 දිනට තවදුරටත් අයකර ගත යුතු මුදල රු.මිලියන 885.7 ක් බව. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 06 දෙනෙකු වෙත වැටුප් සංශෝධන හා චක්‍රලේඛ වලට අනුකූල නොවන පරිදි අන්තර් දීමනාව ලෙස රු.872,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අය කර විශ්‍රාම වැටුප නිවැරදි කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇති බව. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඇ) | කැගල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 04 දෙනෙකු සඳහා අදාළ දුබලතා විශ්‍රාම වැටුප 2018 ජූලි 17 දිනැති 9/2008 (සංශෝධන) අනුව ගැලපුම් කර තිබුණ ද එම විශ්‍රාමිකයින්ට වැඩිපුර ගෙවා තිබූ රු.536,008 ක මුදල 2023 නොවැම්බර් දක්වා ආපසු අයකර ගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අය කරමින් පවතින බව. | වැඩිපුර ගෙවීම් නිවැරදිව ගණනය කර කඩිනමින් අය කළ යුතුය. |
| (ඈ) | හමුදා ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් පරීක්ෂාවේදී හමුදා සේවා වැටුප් සමඟ ජීවන වියදම් දීමනා ගෙවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් සමඟ ගෙවන ජීවන වියදම් දීමනාව චක්‍රලේඛවලට අනුගත වෙමින් නිවැරදිව නතර කර තිබුණද විශ්‍රාමිකයින් 23 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවා තිබූ රු.1,715,550 ක මුදල 2023 නොවැම්බර් වනවිටත් අයකර නොතිබූ බව දත්ත පද්ධතිය පරීක්ෂාවේ දී අනාවරණය විය. | වැඩිපුර ගෙවීම් වාරික ලෙස අය කිරීමට දත්ත පද්ධතියට ඇතුළත් කරනු ඇති බව. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි විශ්‍රාමිකයෙකුට යැපීම් දීමනාව 2013 මාර්තු මාසයේ සිට 2023 සැප්තැම්බර් මස දක්වා රු. 342,900 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අය කිරීමට ආරම්භ කර ඇති බව. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඊ) | 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සේවකයකු මාසිකව ලබන ජීවන වියදම් දීමනාව රු.7,800 ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව ලබාගත නොහැකි බව පදනම් කොටගෙන එකම කරුණක් මුල් කරගෙන පැන නගින්නා වූ විශ්‍රාම වැටුපකට හා දීමනාව යන දෙකටම ජීවන වියදම් දීමනාව ගෙවීම මත භේදයට තුඩුදෙන කරුණක් බව විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව විශ්‍රාම වැටුප හා යැපීම් දීමනා අවස්ථා දෙකේදීම ගෙවා තිබීමෙන් බමුණාකොටුව, වීරඹුගෙදර, හංවැල්ල, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 16 දෙනෙකු සඳහා රු.5,938,755 ක් වැඩිපුර ගෙවා තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2014 අනුව රු.7,800 සීමාව ඉක්මවා යාමක් සිදු වී නොමැති නිසා වැඩිපුර ගෙවීමක් සිදු වී නොමැති බව. | එකම කරුණක් මූලික කරගෙන පැන නැගුණු විශ්‍රාම වැටුප හා යැපීම් දීමනාවට තවත් දීමනාවක් ලෙස ජීවන වියදම් දීමනාව අවස්ථා දෙකේම ගෙවීම සම්බන්ධව සලකා බැලිය යුතුය. |
| (උ) | විදේශ විශ්‍රාම වැටුප් අංශය විසින් මියගිය විදේශ විශ්‍රාමිකයන් (2023 හා ඊට පෙර වර්ෂවල) ලෙස හඳුනාගත් විශ්‍රාමිකයන් සඳහා වැඩිපුර ගෙවා ඇති බැංකුවෙන් ආපසු ගෙන්වා ගතයුතු ශේෂයන්ගෙන් 2023 වර්ෂයේ දී බැංකුවට ඉදිරිපත් කරන ලද වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් අයකර ගැනීම් පිළිබඳ ලේඛනය අනුව 2023 දෙසැම්බර් 31 දිනවන විට රු.29,539,809 ක මුදලක් තවදුරටත් අයකරගත යුතු බව නිරීක්ෂණය විය. මෙම ශේෂය තුළ 2023 වර්ෂයට පෙර වර්ෂවල දී මියගිය විශ්‍රාමිකයන් සඳහා වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල රු. 15,506,715 බවද නිරීක්ෂණය විය. | තවදුරටත් අයකර ගත යුතු ශේෂය අයකර ගැනීමට ලිපි හා දුරකතන ඇමතුම් මඟින් බැංකු වෙත දැනුම් දී ඇති බව. | වැඩිපුර ගෙවීම් ඇතිනොවන පරිදි කටයුතු කල යුතු අතර වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඌ) | මහරගම, කැස්බෑව හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 05 දෙනෙකු මිය ගිය දිනය හඳුනාගෙන තිබුණද වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් රු.1,936,086 ක් 2023 නොවැම්බර් දක්වා අය කර නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට ඉදිරි කටයුතු කරන බව ප්‍රාදේශිය ලේකම්වරු දැනුම් දී ඇති බව. | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි මිය ගිය දිනයන් කඩිනමින් හඳුනා ගෙන විශ්‍රාම වැටුප් ගෙවීම නතර කළ යුතු අතර වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකුට වැඩිපුර ගෙවන ලද දුබලතා වැටුප් එකතුව රු.323,763 ක් අයකර ගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවන ලද දුබලතා වැටුප අය කර ගැනීම සඳහා දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් සඳහන් කර ඇති බව. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කළ යුතුය. |

## 3.2 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද විගණන විමසුම් 42 කින් විගණන විමසුම් 10 කට 2024 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එවන පිළිතුරු අඩුපාඩු සහිත බැවින් ඒවා පරීක්ෂා කර එම කාර්යාල දැනුවත් කරවා එම අඩුපාඩු සකස් කර නැවත පිළිතුරු ලබා ගනිමින් අවසාන පිළිතුර සකස් කළ යුතු බැවින් ඒ සඳහා කාල ප්‍රමාදයක් සිදු වන බව. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයෙකුට අදාලව වැන්දඹුවගේ දික්කසාද සහතිකය පරීක්ෂා කිරීමකින් තොරව විවාහ සහතිකය මත පදනම්ව විශ්‍රාම වැටුප සක්‍රීය කර තිබීම හේතුවෙන් වැඩිපුර ගෙවන ලද මුදල රු.355,743 ක් බව නිරීක්ෂණය විය. | යාපනය දිස්ත්‍රික් උසාවිය 1430 නඩුවට සම්බන්ධ නඩු වාර්තාව හෝ ඊට අදාළ ලේඛන කිසිවක් ලේඛනාගාරයේ නොමැති බව සඳහන් කර ඇති බවත් විවාහ සහතිකයට (දෙවන) අනුව නවමන් මන්නිය සිංහම් යන අයගෙන් දික්කසාද වූ පුරුෂයා ලෙස හා 1430 නඩු අංකය දක්වා ඇති බව. | නඩු අංක 1430 යටතේ දික්කසාද වී ඇති බවත් විවාහ සහතික අංක 7870 යටතේ විවාහ වී ඇති බවත් සඳහන් කර වැන්දඹුව විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා සාක්ෂි සනාථ කරගත යුතුය. |
| (ආ) | අංක 15-14578 දරන විශ්‍රාම වැටුප 2022 අප්‍රේල් මස සිට ස්ථිරව නතර කර තිබූ අතර 2008 ජනවාරි 01 සිට 2022 මාර්තු 10 දින දක්වා වැඩිපුර ගෙවූ රු.1,419,750 ක | මු.රෙ.104 වාර්තාවේ නිර්දේශ අනුව වැටුප් පරිවර්තනය සකස් කර හිඟ මුදලක් ගෙවීමට ඇත්නම් එම මුදලින් අයකර | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කිරීමට කටයුතු කල යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මුදලින් රු. 1,405,750 ක් අය කර ගැනීම සඳහා 2023 නොවැම්බර් දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ගැනීමට කටයුතු කරන බව. | |
| (ඇ) | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශ්‍රාම වැටුප් ලබන අනත් දරුවෙකුගේ අවුරුදු 26 සම්පූර්ණ වීමෙන් පසු ඉතිරි අනත්දරුවාට ලැබිය යුතු සම්පූර්ණ වැටුප සමඟ සම්පූර්ණ ජීවන වියදම් දීමනා හා අන්තර් දීමනා හිමිගන්වා නොමැතිවීම හේතුවෙන් රු.500,491 ක් අඩුවෙන් ගෙවා තිබුණි. | නිවැරදි බව පරීක්ෂා කිරීමෙන් පසු ගෙවීමට නියමිත බව. | පරීක්ෂා කර කඩිනමින් ගෙවිය යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 2030 දී ඉටුකර ගැනීමට ඉලක්ක කර ඇති තිරසාර සංවර්ධනය සඳහා වන අරමුණු යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එක් අරමුණක් පමණක් හඳුනාගෙන තිබුණි. එම අරමුණ සම්බන්ධයෙන් ද පැහැදිලි ඉලක්ක පිහිටුවා නොමැති අතර පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ක්‍රමවත්ව පිහිටුවීමක් සිදුකර නොමැත. තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් ද හඳුනාගෙන නොතිබුණි. | මෙම අරමුණ ළඟා කර ගැනීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් සිදු කළ නොහැකි වුවද විශ්‍රාම යාමෙන් පසු ලබාදිය හැකි ප්‍රතිලාභ පිළිබඳව, සමාජයේ සියළු ස්ථර ආවරණය වන පරිදි පුළුල් විශ්‍රාම වැටුප් ආවරණ ක්‍රමයක් සැකසීමට අදාල මූලික සංකල්පය සහ යෝජනා 2020 වර්ෂයේදී "සැමට විශ්‍රාම" යෝජනාවලිය මගින් ඉදිරිපත් කර ඇති බව . | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 5. යහපාලනය

### 5.1 මහජනතාව වෙත සේවා ඉටු කිරීම.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බාල වයස්කාර දරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ විමෙන් අනතුරුව අදාල බැංකු පාස් | අදාල ලිපිනයන් හී පදිංචි වී නොමැති බැවින් නිදහස් | වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් |

| | | | |
|---|---|---|---|
| | පොත බාල වයස්කරුවන් වෙත හිමි ගැන්වීමට කටයුතු කලයුතු වුවත් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකතු වටිනාකම රු. 613,636 ක් වන බැංකු පාස්පොත් 04 ක් හා ස්ථාවර තැන්පතු සහතික 01 ක් එම බාල වයස්කරුවන් අදාල ලිපිනයන්හි පදිංචි වී නොමැති බැවින් හිමි ගැන්වීමට කටයුතු කර නොතිබුණි. | කිරීම ගැටළුකාරී වී ඇති බව. | අනතුරුව අදාල බැංකු පාස් පොත බාල වයස්කරුවන් වෙත හිමි ගැන්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2012 පෙබරවාරි 27 දින වයස අවු. 60 සම්පූර්ණ වී විශ්‍රාම ගිය වෛද්‍යවරයකු වෙත පොළොන්නරුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය මඟින් තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම මත 2024 ජනවාරි මාසය වන විට වර්ෂ 11 ක් ගත වී තිබුණ ද විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට නොහැකි වී තිබුණි. | විශ්‍රාම වැටුප සකස් කිරීම සඳහා ප්‍රථම වරට ලිපි ගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත්තේ 2014.04.02 දින වන අතර ලිපි ගොනුව පරික්ෂා කිරීමෙන් අනතුරුව එහි අඩුපාඩු කිහිප වරකදී ගෙන්වා ගෙන ඇති නමුත් තවදුරටත් විශ්‍රම වැටුප් දෙපාර්තමේන්තුව ඉල්ලා ඇති ලිපි ලේඛන (2023.07.05 දිනැති ලිපියෙන් ) වෛද්‍යවරාගේ පෞද්ගලික ලිපිගොනුව තුළ අන්තර්ගතව නොමැති බැවින් වෙනත් ආයතන කිහිපයක් වෙත එම තොරතුර ඉල්ලා ලිපි යොමු කර ඇති බවත් වහාම අදාළ අඩුපාඩු සම්පූර්ණ කර එවන බව. | තොරතුරු සම්පූර්ණ කර කඩිනමින් ගෙවීම් ආරම්භ කළ යුතුය. |